මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011-2484500, 011-2484600, 011-2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2449823
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல / My No: BD/CBP/01/01/05-2022
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2022.09.02

**ජාතික අයවැය චක්‍රලේඛ අංක: 05/2022**

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල සභාපතිවරුන්

**2023 අයවැය කැඳවීම**

**2023-2025 මැදිකාලීන අයවැය රාමුව තුල 2023 වාර්ෂික අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම සඳහා මාර්ගෝපදේශ**

## 01. පසුබිම

ශ්‍රී ලංකා ආර්ථිකය නිදහසින් පසු උද්ගත වූ වඩාත්ම අභියෝගාත්මක තත්ත්වයට වර්තමානයේදී මුහුණ දී සිටියි. මෙම තත්ත්වය මත රාජ්‍ය වියදම් විශාල ලෙස ඉහළ යාම, රාජ්‍ය ආදායම අතිශය සීමාසහිත වීම සහ රජයට ණය ලබාගැනීමේ හැකියාව අවම වීම යන කරුණු හේතුවෙන් රාජ්‍ය මූල්‍ය අවකාශය අතිශයින් සීමාකාරී වී ඇත. මෙම සන්දර්භය තුළ 2023 ජාතික අයවැය සම්පාදනය කිරීම අතිශයින් අභියෝගාත්මක වී ඇත.

ඉහත පසුබිම තුළ, 2023-2025 මැදිකාලීන අයවැය රාමුවට අනුකූලව, 2023 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තු සකස් කිරීම පිළිබඳ මාර්ගෝපදේශ ලබා දීම මෙම චක්‍රලේඛයේ අරමුණ වේ.

ආර්ථික අර්බුදය හමුවේ දැඩි බලපෑමකට ලක්වී ඇති ජන ජීවිතය යථාවත් කිරීමත්, දුර්වල ආර්ථික දර්ශක තවදුරටත් දුර්වල වීම වැළැක්වීමත්, ඉනික්බිතිව සාර්ව ආර්ථික ස්ථායීතාවය හා ආර්ථික වර්ධනය සඳහා වන පදනම සකස් කිරීමත් ඉලක්ක ගතව, 2023 අයවැය සකස් කළ යුතු ය. එහිදී, උද්ගතවී ඇති අර්බුදය කළමනාකරණය කිරීම සඳහා සමස්ත රාජ්‍ය යාන්ත්‍රණයම සාමූහිකව කටයුතු කළ යුතු වේ (whole of government approach). තවද, වැය දරන ආයතන විසින් හුදෙක් ස්වකීය ආයතනයේ කටයුතු පිළිබඳව පමණක් සැලකිල්ලට ගෙන වියදම් ඇස්තමේන්තු සකස් කිරීමෙන් ඔබ්බට ගොස් එම වියදම් මූල්‍යනය කිරීම සඳහා අක්මුදල් ලබා දීමට හැකියාවක් පවතීද යන්න පිළිබඳවද දැඩි අවධානය යොමු කළ යුතු ය.

## 02. 2023-2025 මැදිකාලීන සාර්ව ආර්ථික ගමන් මග

වාර්ෂික අයවැය සකස් කිරීමේදී මැදිකාලීන හා දිගුකාලීන සාර්ව ආර්ථික ඉලක්ක හා රජයේ ප්‍රතිපත්ති/ ප්‍රමුඛතාවලට අනුගත වන පරිදි ආදායම් හා වියදම් ගලපාගත යුතු වේ. ඒ අනුව, 2023-2025 මැදිකාලය අවසන් වන විට ප්‍රාථමික ගිණුමේ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 2 ක් පමණ වන අතිරික්තයක් අත්කර ගැනීමේ අරමුණ පෙරදැරිව 2023 අයවැය සකස් කළ යුතු වේ.

එහිදී අයවැය හිඟය අඩු කර ගැනීම සඳහා රාජ්‍ය ආදායම වර්ධනය කරගැනීම ප්‍රමුඛ අවශ්‍යතාවයක් වන නමුත් ඒ සඳහා යම් කාලයක් ගතවන බැවින් වියදම් අවම කිරීමේ විකල්ප ක්‍රියාත්මක කිරීම අනිවාර්ය වී ඇත. රාජ්‍ය සේවයේ ගුණාත්මකභාවය එලෙසම පවත්වාගෙන යමින් වියදම් අඩු කර ගැනීමට නම් ඵලදායීතාවය

වැඩි කර ගැනීම අනිවාර්ය වේ. එබැවින් 2023 අයවැය සකස් කිරීමේ මූලික තේමාව විය යුත්තේ "අවම යෙදවුම් තුළින් පරිවර්තනීය වෙනසක් සිදු කිරීම" යන්නයි. එය සෑම රාජ්‍ය ආයතනයකම පොදු අරමුණ බවට පත් කර ගත යුතු වේ.

## 03. ප්‍රමුඛතා ක්ෂේත්‍ර/අංශ

2023-2025 මැදිකාලය තුළ ජනතාවට සහ රටට කඩිනම් ප්‍රතිලාභ ලැබෙන හා ආර්ථික අර්බුදය හේතුවෙන් පසුගාමී වී ඇති ක්ෂේත්‍ර නගා සිටුවමින් ජන ජීවිතය යථාවත් කළ හැකි ව්‍යාපෘති/වැඩසටහන් සඳහා ඉදිරි අයවැය මගින් ප්‍රමුඛතාවය ලබාදිය යුතු වේ. ඒ අනුව, 2023 වසරේ අයවැය සකස් කරන විට පහත ක්ෂේත්‍ර/අංශ කෙරෙහි ප්‍රමාණවත් අවධානය යොමු කළ යුතු ය.

i. පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍රවලට කඩිනමින් යොමුවීම හා අඛණ්ඩ බලශක්ති සැපයුමක් තහවුරු කිරීම
ii. පොදු ප්‍රවාහන සේවය වැඩිදියුණු කිරීම සහ විධිමත්ව පවත්වාගෙන යාම
iii. රටට හිතකර සෘජු විදේශ ආයෝජන දිරිමත් කිරීම (වේගයෙන් දියුණු වන අනාගත ලෝකයේ ආර්ථික බල කේන්ද්‍රය වන ඉන්දීය සාගර කළාපය තුළ ශ්‍රී ලංකාවේ පිහිටීම පිළිබඳ ප්‍රවර්ධනය කිරීම, ආයෝජනයට හිතකර පරිසරයක් ඇති කිරීම, වරාය නගර ව්‍යාපෘතිය සක්‍රීය කිරීම, ප්‍රාග්ධන වෙළඳපොළ ප්‍රතිසංස්කරණය කිරීම හා ශ්‍රම බලකාය තුළ කාන්තා දායකත්වය වැඩි කිරීම ඇතුළු කම්කරු නීති ප්‍රතිසංස්කරණ)
iv. රටේ පවත්නා ආර්ථික අර්බුදය හේතුවෙන් බලපෑමට ලක්වී ඇති සංචාරක ව්‍යාපාරය හා සුළු පරිමාණ ව්‍යාපාරවලට යලි නැඟී සිටීමට උපකාර වන ප්‍රතිපත්ති සැකසීම හා අවශ්‍ය සහායන් ලබාදීම
v. ව්‍යවසායකත්ව ප්‍රවර්ධනය, නව රැකියා උත්පාදනය හා තරුණ ජනතාව ආර්ථික ක්‍රියාකාරකම් සඳහා යොමුකර ගැනීම සඳහා වන විශේෂ වැඩසටහන් / ව්‍යාපෘති
vi. රට තුල ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීම
vii. තරඟකාරී අපනයන ආර්ථිකයක් ඇති කිරීම හා වෙළඳපොළ නිදහස්කරණය
viii. විදේශ ප්‍රේෂණ වර්ධනය කිරීම සඳහා වන වැඩසටහන්
ix. පාඩු ලබන රාජ්‍ය ව්‍යාපාර ප්‍රතිව්‍යුහගතකරණය හෝ වසා දැමීම, සමාන කටයුතු කරන ආයතන ඒකාබද්ධ කිරීම, සංස්ථාපිත යහපාලනය ශක්තිමත් කිරීම හා රාජ්‍ය ව්‍යාපාරවල මූල්‍යමය යෝග්‍යතාවය තහවුරු කිරීම ඇතුළු රාජ්‍ය ව්‍යාපාර ප්‍රතිසංස්කරණය
x. අල්ලස, වංචාව හා දූෂණය අවම කිරීම සඳහා අවශ්‍ය නීතිමය රාමුව බලගැන්වීම
xi. දිළිඳු හා අව-වරප්‍රසාදිත කණ්ඩායම් රැකබලා ගැනීම හා ඔවුන්ව ආර්ථිකමය වශයෙන් සවිබල ගැන්වීමට අවශ්‍ය වැඩපිලිවෙළක් සැකසීම
xii. අපනයන අභිමුඛ කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම තුළින් ගෝලීය නිෂ්පාදන දාමය හා සම්බන්ධ වීම සහ අපනයන ආදායම ඉහල නංවා ගැනීම
xiii. පර්යේෂණ හා සංවර්ධන අංශය (Research and Development) පුළුල් කිරීම හා නවෝත්පාදන දිරිගැන්වීම හා ඒවා පුළුල්ව යොදා ගැනීමට පහසුකම් සැලසීම
xiv. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පුළුල් කිරීම හා ඩිජිටල්කරණය ශක්තිමත් කිරීම
xv. සහනාධාර ලබාදීමේ ක්‍රමවේදය කාර්යක්ෂම හා විධිමත් කිරීම
xvi. ගෝලීය රැකියා වෙළඳපොළට ගැලපෙන පරිදි මෙරට තරුණ ප්‍රජාව පුහුණු කිරීම
xvii. ආර්ථික වර්ධනය දිරිමත් කළ හැකි ව්‍යාපෘති ප්‍රමුඛතාවය මත තෝරා ගැනීමට කටයුතු කිරීම

## 04. උපාය මාර්ග හා ක්‍රියාකාරකම්

අපේක්ෂිත සාර්ව ආර්ථික ඉලක්කයන් ළඟා කර ගැනීම සඳහා පහත සඳහන් උපාය මාර්ග/ක්‍රියාකාරකම් හඳුනාගෙන ඇත.

i. පුනරාවර්තන වියදම් අඩුකිරීම හා අනවශ්‍ය වියදම් කපා හැරීම.

(අ). "රාජ්‍ය වියදම් පාලනය කිරීම" මැයෙන් නිකුත් කරන ලද අයවැය චක්‍රලේඛ 03/2022 හි විධිවිධාන දැඩිව අනුගමනය කිරීම.

(ආ). ඒකාබද්ධ අරමුදලින් වැටුප් ගෙවන තනතුරු සඳහා නව බඳවාගැනීම් අත්හිටුවීම.

(ඈ). අනුමත ඉන්ධන සීමා පිළිබඳ චක්‍රලේඛ උපදෙස් ඉක්මවා කටයුතු කරන බව වාර්තා වී ඇති බැවින් අදාළ අනුමත සීමා අනුව පමණක් ඇස්තමේන්තු සකස් කිරීම.

(ඇ). 2022 සංශෝධිත අයවැය ඇස්තමේන්තු අනුව, ඒ ඒ පුනරාවර්තන වැය විෂය යටතේ සමස්ත වියදමින් සියයට 5 කට වඩා වියදම් දරන ආයතනවල වියදම් සම්බන්ධයෙන් විශේෂ සමාලෝචනයක් සිදු කර වියදම් අඩු කර ගැනීම සඳහා ක්‍රමවේද හඳුන්වා දීම.

ii. ඇස්තමේන්තු සකස්කිරීමේදී සාම්ප්‍රදායිකව පෙර වර්ෂයේ වියදම් දෙස බලා උද්ධමනයට ගැලපීම් කර ඇස්තමේන්තු සකස් කිරීම වෙනුවට ශුන්‍ය පාදක ප්‍රවේශයකින්, ස්වකීය ආයතනය වෙත ව්‍යවස්ථාපිතව නියම වී ඇති කාර්යයන් කෙරෙහි දැඩි අවධානයක් යොමුකර, අවම වියදමකින් ආයතනයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය වන ප්‍රතිපාදන ඇතුළත් කිරීමට කටයුතු කිරීම.

iii. ආර්ථික අර්බුදයට කඩිනම් විසඳුම් ලබා දිය හැකි ඍජු හා කඩිනමින් ප්‍රතිලාභ ලැබෙන ආයෝජන ස්වරූපයේ ව්‍යපෘති සඳහා පමණක් මූලධන වියදම් සීමා කිරීම. සීමිත රාජ්‍ය මූල්‍ය අවකාශය පුළුල් කිරීමේ විකල්පයක් ලෙස ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ දී රාජ්‍ය පෞද්ගලික සහයෝගීතාවය පිළිබඳව අවධානය යොමු කිරීම.

iv. සාර්ව ආර්ථික ගැලපුම්වල බලපෑමෙන් පහසුවෙන් අවදානමට ලක්විය හැකි කණ්ඩායම් සඳහා ඇති විය හැකි අහිතකර බලපෑම් අවම කිරීම වෙනුවෙන් කෙටි කාලීන විශේෂ සමාජ ආරක්ෂණ වැඩ පිළිවෙළක් හඳුන්වාදීම.

v. දීර්ග කාලයක් තිස්සේ පවත්වාගෙන යන සහනාධාර වැඩසටහන් නැවත සමාලෝචනය කර, ප්‍රතිලාභීන් ආර්ථික වශයෙන් තිරසාරව හා දිගුකාලීනව බලගැන්වීමට කටයුතු කිරීම සහ වාර්ෂිකව, ඉලක්කගත ප්‍රතිලාභීන් සංඛ්‍යාවක් සවිබල ගැන්වීමෙන් අනතුරුව සහනාධාර වැඩසටහනෙන් ඉවත් කිරීම.

vi. පාඩු ලබන රාජ්‍ය ව්‍යවසායන් ප්‍රතිව්‍යුහගත කිරීම/වසාදැමීම.

vii. සමාන කාර්යයන්හි නිරත වන ආයතන ඒකාබද්ධ කිරීම.

viii. කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය සහ කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් රජය සතු ගොඩනැගිලි ඉඩම් සහ වාහන ඇතුළු චංචල හා නිශ්චල දේපළ පිළිබඳව විධිමත් අධ්‍යයනයක් සිදු කොට ඒවා ප්‍රශස්ථ ලෙස භාවිත කිරීම සහ ආදායම් උපයා ගැනීමේ ක්‍රියාකාරකම්වලට යෙදවීම

ix. නිල රථයක් නිකුත් කරන ලද නිලධාරීන් හෝ කුලී පදනම මත රාජකාරී ප්‍රවාහන අවශ්‍යතා සඳහා පෞද්ගලික වාහන යොදා ගැනීමට අවසර දී ඇති නිලධාරීන් තමන්ට හිමි හිමිකම පමණක් භුක්ති විඳින බව තහවුරු කිරීම.

## 05. වියදම් ඇස්තමේන්තු සකස් කිරීම

ආර්ථිකය යථාවත් කිරීමේදී කෙටි කාලීන සැලසුම් තුළ වියදම් අඩු කිරීම ප්‍රමුඛතාවයක් ලෙස හඳුනාගෙන ඇති බැවිනුත්, රජයේ ණය ගැනීමේ හැකියාව අතිශය සීමාකාරී වන බැවිනුත්, 2023-2025 කාලය තුළ හැකි සෑම විටම වියදම් දැඩි පාලනයකට ලක් කිරීමට සිදු වනු ඇත. එසේම, පවතින ආර්ථික අර්බුදය සමනය කිරීමේ අවශ්‍යතා සඳහා යොදා ගැනීමට හැකිවන පරිදි විදේශ අරමුදල් ලබා දෙන ආයතන විසින් ඇතැම් මහා පරිමාණ ව්‍යාපෘති මූල්‍යනය කිරීම සඳහා ගිවිසුම්ගත විදේශ අරමුදල්, ප්‍රතිසැලසුම් කිරීම (repurposing) සඳහා දැනටමත් අවශ්‍ය පියවර ගෙන ඇත. ඒ අනුව, ඉදිරි අයවැය සම්පාදනයේදී වඩාත් අත්‍යවශ්‍ය දේ වෙනුවෙන් ඇතැම් අවශ්‍යතා කැපකිරීමට සිදුවන අතර සාම්ප්‍රදායිකව සම්පත් වැඩියෙන් යෙදවූ ඇතැම් අංශවලට ලබාදෙන ප්‍රතිපාදන සීමාකර ආර්ථිකයට සහ රටට ඍජු හා කඩිනම් ප්‍රතිලාභ ලබා දෙන සහ පීඩාවට පත් ජනතාවට සහන ලබාදෙන අංශවලට වැඩි ප්‍රමුඛතාවයක් ලබාදීමට සිදුවනු ඇත.

### 5.1 මූලධන වියදම්

i. **ආයතනික මූලධන වියදම්**

(අ). අයවැය චක්‍රලේඛ 03/2021 මගින් රථ වාහන මිළ දී ගැනීම සම්බන්ධයෙන් පනවා ඇති සීමා කිරීම් 2023 වර්ෂය සඳහා ද එලෙසම ක්‍රියාත්මක වේ.

(ආ). 2023 වර්ෂයේදී, රාජ්‍ය ආයතන සඳහා නව කාර්යාල උපකරණ හා උපාංග මිලදී ගැනීම සඳහා ප්‍රතිපාදන ඇතුළත් නොකළ යුතු ය.

(ඇ). ධාරිතා සංවර්ධනය යටතේ ඒකාබද්ධ අරමුදලින් ගෙවීම් කළ යුතු විදේශ පුහුණුවීම් සඳහා ප්‍රතිපාදන ඇතුළත් නොකළ යුතු ය. එසේ වුව ද, දැනටමත්, ආරම්භ කර ඇති පුහුණුවීම් සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන පමණක් සලකා බලනු ඇත. එවැනි පුහුණු අවශ්‍යතා, අතත්‍ය ක්‍රම (virtual methods) හා දේශීය ආයතන මගින් සපුරා ගැනීමට කටයුතු කළ යුතු ය.

(ඈ). දේශීය පුහුණුවීම් ද අත්‍යවශ්‍යම සේවා අවශ්‍යතාවයන් සඳහා පමණක් සීමා කළ යුතු ය.

ii. **සංවර්ධන වියදම්**

(අ) ඔබ විසින් 2023 අයවැයට ඇතුළත් කරනු ලබන සංවර්ධන වියදම් සම්බන්ධයෙන් ඇමුණුම 1 හා 2 හි දැක්වෙන ආකෘතීන් මගින් ඉල්ලා ඇති තොරතුරු සැපයීම අනිවාර්ය වේ.

(ආ) සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් ඇස්තමේන්තු සකස් කිරීමේදී, ඒ ඒ උප-ව්‍යාපෘතිය යටතේ සම්මත වැය විෂයන්ට අනුව වෙන් වෙන්ව බෙදා ප්‍රතිපාදන ඇතුළත් කළ යුතුය. නිදසුනක් ලෙස යම් ව්‍යාපෘතියකින් ගොඩනැඟිලි ඉදිකිරීම්, යන්ත්‍ර මිලදී ගැනීම්, මෘදුකාංග සංවර්ධනය ආදිය සඳහා මුදල් යොදවන්නේ නම් අදාළ උප-ව්‍යාපෘතිය යටතේ එකිනෙක කටයුතු සම්බන්ධයෙන් විශේෂිතව දක්වා ඇති සම්මත වැය විෂයන් අනුව ප්‍රතිපාදන බෙදා වෙන් කළ යුතුය.

(ඇ) 2022-2025 මැදිකාලීන අයවැය රාමුව තුළ නව ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා ප්‍රමාණවත් මූල්‍ය පහසුකම් සලසා ගැනීම අසීරු වේ. එබැවින්, අමාත්‍යාංශ යටතේ දැනට ක්‍රියාත්මක කරන සංවර්ධන ව්‍යාපෘති සමාලෝචනය කර 03 ඡේදයේ සඳහන් ප්‍රමුඛතා ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි එම ව්‍යාපෘති ප්‍රතිසැලසුම් කිරීමට ක්‍රියා කරන්නේ නම් ප්‍රතිපාදන ලබා දීමේදී, එවැනි ව්‍යාපෘතීන් ප්‍රමුඛත්වයෙහි ලා සලකනු ලැබේ.

(ඈ). 03 ඡේදයේ සඳහන් ප්‍රමුඛතා ක්ෂේත්‍රවලට අදාළව කෙටි කාලීනව ප්‍රතිලාභ ලබා දෙන, එක් එක් ආයතනයේ විෂයපථයට අයත් වන, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය හෝ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සහිත නව ව්‍යාපෘති පවතී නම් ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබාදීම සලකා බැලීම පිණිස ඇමුණුම් 1 හා 2 හි දැක්වෙන තොරතුරුද සමඟ ඉදිරිපත් කළ යුතු ය.

(ඉ). දැනට ආරම්භ කර ඇති එහෙත් භෞතික ප්‍රගතියක් පෙන්නුම් නොකරන හෝ ඉතා අඩු ප්‍රගතියක් සහිත වැඩසටහන්/ව්‍යාපෘති සම්බන්ධයෙන් 2023 වර්ෂය සඳහා ප්‍රතිපාදන ඉල්ලුම් කිරීමට පෙර ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව සහ ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ එක්ව සමාලෝචනය කර ඒවා තවදුරටත් ඉදිරියට පවත්වාගෙන යන්නේද යන්න නිශ්චය කළ යුතුය.

(ඊ). අයවැය යෝජනා ලෙස හෝ විදේශ මූල්‍ය සහාය මත ආරම්භ කරන ලද ව්‍යාපෘතිවල කාලය අවසන් වූ පසු දේශීය අරමුදල් මඟින් තවදුරටත් පවත්වාගෙන යනු ලබන ව්‍යාපෘති සම්බන්ධයෙන් ද ඉහත පරිදි කටයුතු කළ යුතු ය.

(උ). මේ වන විට ව්‍යාපෘති කළමනාකරණ ඒකක/ව්‍යාපෘති කාර්යාල පිහිටුවා ඇති නමුත් වැඩ ආරම්භ කර නොමැති හා ඉදිරියට ක්‍රියාත්මක වීම අවිනිශ්චිත වැඩසටහන්/ව්‍යාපෘති සම්බන්ධයෙන් නිශ්චිත තීරණයක් ලැබෙන තුරු එම ඒකක/ කාර්යාල ක්‍රියාත්මක කිරීම අත්හිටුවිය යුතු ය.

(ඎ). ප්‍රති-සැලසුම් කළ විදේශීය මූල්‍යන ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන ඉල්ලුම් කිරීමේදී මුල් ව්‍යාපෘතිය තුළම ප්‍රතිපාදන ඇතුළත් කරනවාද නොඑසේ නම් ප්‍රති-සැලසුම් කළ කාර්යයට අදාළ වැය ශීර්ෂය යටතේ ප්‍රතිපාදන වෙන් කරනවාද යන්න පිළිබඳව පුළුල්ව සොයා බලා නියමිත පරිදි ප්‍රතිපාදන ඇතුළත් කළ යුතු ය.

(එ). පෞද්ගලික අංශයේ සෘජු ආයෝජන ලෙස හෝ රාජ්‍ය-පෞද්ගලික සහයෝගිතාවයන් (Public Private Partnership) සඳහා ශක්‍යතාවය සහිත ව්‍යාපෘති අළුතින් ආරම්භ කිරීම දිරිමත් කරන අතර සාම්ප්‍රදායික රාජ්‍ය ආයෝජන තුළින් නව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම අධෛර්යමත් කෙරේ. රාජ්‍ය-පෞද්ගලික සහයෝගීතාවය යටතේ ආරම්භ කරන ව්‍යාපෘතිවල රජයේ මූල්‍ය දායකත්වය අවම මට්ටමක පවත්වා ගැනීමට කටයුතු කළ යුතු ය. එමෙන්ම, ව්‍යාපෘතියෙන් උත්පාදනය වන ආදායම මඟින් වියදම් හැකිතාක් දුරට ආවරණය කර ගැනීමට හැකි ව්‍යාපාරික ආකෘති (business models) සකස් කර ගත යුතු ය. එහි දී, ව්‍යාපෘතියේ මුළු පිරිවැය, රජය මඟින් අදාළ පෞද්ගලික පාර්ශ්වය වෙත සිදුකරන වාර්ෂික ගෙවීම් (annuity payments) තුළින් පියවීමට යටත්ව සැලසුම් කරනු ලබන ව්‍යාපාරික ආකෘති සහිත ව්‍යාපෘති, ආරම්භ නොකළ යුතු ය.

### 05.2 පුනරාවර්තන වියදම්

පුනරාවර්තන වියදම් සඳහා ඇස්තමේන්තු පිළියෙළ කිරීමේ දී පහත සඳහන් කරුණු සලකා බැලිය යුතු ය.

#### i. වැටුප්, වේතන, අතිකාල සහ වෙනත් දීමනා

(අ). 2023 වර්ෂය තුළ රාජ්‍ය සේවයට නව බඳවා ගැනීම් සිදු නොකරන බැවින් ඒ සඳහා ප්‍රතිපාදන වෙන්කරනු නොලැබේ. එමෙන්ම, වැටුපට අමතරව සිදුකරනු ලබන ගෙවීම් සම්බන්ධයෙන් අයවැය චක්‍රලේඛ 03/2022 හි උපදෙස් 2023 වර්ෂය සඳහා ද අදාළ කරගත යුතු ය.

(ආ). 2022.08.01 දිනට තත්‍ය සේවක සංඛ්‍යාව පදනම් කරගෙන, 2023 වසර සඳහා වැටුප්, වේතන හා අනෙකුත් දීමනා ඇස්තමේන්තු, එක් එක් නිලධරයන් වෙනුවෙන් වෙන් වෙන්ව ගණනය කර, එම තොරතුරු ආයතන මට්ටමින් සකස් කර, ඇමුණුම් 3 හි දක්වා ඇති ආකෘතියට අනුව ඉදිරිපත් කළ යුතු ය. වැය විෂය විස්තර 1503 යටතේ පුද්ගල පඩිනඩි සඳහා ප්‍රතිපාදන ලබාගන්නා නිලධාරීන් පිළිබඳවද, මෙම ආකෘතිය අනුව එක් එක් ආයතනය සඳහා වෙන වෙනම විස්තර ඉදිරිපත් කළ යුතු ය.

(ඇ). උපාධිධාරී අභ්‍යාසලාභීන් ලෙස බඳවාගෙන දැනට සේවයේ ස්ථිර කර ඇති නිලධාරීන් සඳහා 2023 වර්ෂයට අදාළ පුද්ගල පඩිනඩි හා අනෙකුත් වියදම් එම නිලධාරීන්ගේ තනතුරු ස්ථිර පදනමින් අයත් වන ආයතනවල ඇස්තමේන්තු තුළ ඇතුළත් කළ යුතු ය.

#### ii. සංවර්ධන සහනාධාර හා සුභසාධන වියදම්

වර්තමානයේ පවතින අයහපත් ආර්ථික තත්ත්වයන් හේතුවෙන් සුභසාධන වැඩසටහන් සම්බන්ධයෙන් පුළුල්ව සොයා බලා කටයුතු කෙරෙන බැවින් 2023 වර්ෂය සඳහා ඇස්තමේන්තු සකස් කිරීමේදී යම් නීතියක් මඟින් හෝ අමාත්‍ය මණ්ඩල අනුමැතියක් සහිතව දෙනු ලබන සහනාධාර හැර ආයතන මට්ටමින් තීරණ ගෙන ක්‍රියාත්මක කරන කිසිදු සහනාධාරයක් හෝ සුභසාධන වැඩසටහනක් සඳහා ප්‍රතිපාදන ඇතුළත් නොකළ යුතු ය. එමෙන්ම, අමාත්‍ය මණ්ඩල තීරණයක් පරිදි හෝ වෙනත් නීත්‍යානුකූල අයුරකින් තීරණය කරනු ලැබුවහොත් මිස දැනට ක්‍රියාත්මක වන සහනාධාර වැඩසටහන් සඳහා අනුමත ප්‍රතිලාභීන් සංඛ්‍යාව වැඩි නොකළ යුතු ය.

### 06. අත්තිකාරම් ගිණුම් කටයුතු

රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් සම්බන්ධ ඇස්තමේන්තු, ඇමුණුම 4 මගින් ලබාදී ඇති ආකෘතිය අනුව ඉදිරිපත් කළ යුතු ය. වාණිජ අත්තිකාරම් ගිණුම් පවත්වාගෙන යනු ලබන ආයතන විසින් ඒ සම්බන්ධයෙන් වන ඇස්තමේන්තු, ප්‍රමාණවත් තොරතුරු ඇතුළත් වන පරිදි සුදුසු ආකෘතියකින් ඉදිරිපත් කළ යුතු ය.

## 07. පොදු උපදෙස්

(i). පහත දැක්වෙන ප්‍රමුඛතා අනුපිළිවෙළ අනුව ප්‍රතිපාදන ලබා දීම සිදු කරනු ඇත.

(අ). අත්‍යවශ්‍ය කටයුතු පවත්වාගෙන යාමට අවශ්‍ය ප්‍රතිපාදන
(ආ). ගිණුම් තැබීම හෝ වගකීම්/බැදීම් නිරවුල් කිරීමට අවශ්‍ය වන ප්‍රතිපාදන
(ඇ). අවසන් කිරීමට ආසන්න වැඩ කොටස් අවසන් කිරීම
(ඈ). 5.1 ii (ඇ) හි දැක්වෙන ප්‍රතිසැලසුම් කරන ලද ව්‍යාපෘතීන්
(ඉ). ආරම්භ කර ඇති ව්‍යාපෘති වැඩසටහන්වල ඊළඟ පියවර සඳහා ප්‍රතිපාදන
(ඊ). නව ව්‍යාපෘති සම්බන්ධයෙන් 5.1 ii (ඈ) අවශ්‍යතා සපුරා ඇත්නම් පමණක් සලකා බලනු ඇත.

(ii). තිරසාර සංවර්ධන අරමුණු අංක 5 මගින් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය හා සියලුම කාන්තාවන් හා ගැහැණු ළමුන් සවිබල ගැන්වීම ඉලක්ක කර ඇති බැවින්, වාර්ෂික අයවැය සකස් කිරීමේදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය කෙරෙහි විශේෂ අවධානයක් (gender responsive) යොමු කළ යුතු ය.

## 08. වියදම් ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම

ඉහත කරුණු සලකා බලා නිසි පරිදි පිළියෙළ කරනු ලබන වියදම් ඇස්තමේන්තු අදාළ සියලුම උපලේඛණද සමඟ 2022 සැප්තැම්බර් 14 වන දින හෝ ඊට ප්‍රථම ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතිය (ITMIS) හරහා වියදම් ඇස්තමේන්තු සඳහා 2023 EXP_ES සැලසුම් පිටපත (version) ද අත්තිකාරම් ගිණුම් ඇස්තමේන්තු සඳහා 2023 ADV_ES සැලසුම් පිටපත (version) ද භාවිතා කරමින් ඉදිරිපත් කළ යුතු ය. 2023-2025 වර්ෂ සඳහා වන මැදිකාලීන අයවැය ඇස්තමේන්තුව තුළ 2023 වර්ෂය සඳහා වන වාර්ෂික අයවැය ඇස්තමේන්තුව සහ වර්ෂ 2024-2025 සඳහා වන පුරෝකථන අයවැය ඇස්තමේන්තු මෙම මාර්ගගත පද්ධතිය ඔස්සේ ඇතුළත් කිරීම අනිවාර්ය වේ. ඊට අමතරව, එම ලේඛනවල දෘඩ පිටපත් ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අදාළ මාණ්ඩලික නිලධාරියා වෙත ඉදිරිපත් කළ යුතු ය. ITMIS පද්ධතියට දත්ත ඇතුළත් කිරීම සඳහා යම් සහායක් අවශ්‍ය වන්නේ නම්, දුරකථන අංක 011-2484999 හරහා ITMIS Helpdesk නිලධාරීන් සම්බන්ධ කර ගැනීමට කටයුතු කළ යුතු ය.

## 09. පැහැදිලි කරගැනීම

මේ සම්බන්ධයෙන් තවදුරටත් පැහැදිලි කර ගැනීමට අවශ්‍ය නම් ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ ඔබ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/ආයතනය පිළිබඳ වගකීම දරණ විෂය භාර මාණ්ඩලික නිලධාරියා සම්බන්ධ කර ගැනීමට කටයුතු කළ යුතු ය.

**කේ. එම්. මහින්ද සිරිවර්ධන**
**භාණ්ඩාගාර ලේකම්**

පිටපත්:
1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
4. විගණකාධිපති